බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
**External Degrees and Extension Courses Unit**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**University of Sri Jayewardenepura**

මගේ අංකය / My Number: USJP/EEX/11/2024
ඔබේ අංකය / Your Number:
දුරකථනය / Telephone: 011-2801481, 011-3132496
ෆැක්ස් / Fax: 011-2802753
ලිපිනය / Address: තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල නුගේගොඩ, ශ්‍රී ලංකා / Post Box 10,Gangodawila Nugegoda, Sri Lanka,
වෙබ් අඩවිය / Website: www.external.sjp.ac.lk
විද්‍යුත් තැපෑල / E-mail: info.ext@sjp.ac.lk

2024-07-23

ප්‍රිය ශිෂ්‍ය/ශිෂ්‍යාවනි,

# විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි II පුනර් පරීක්ෂණය (නව නිර්දේශය) 2024 අගෝස්තු/සැප්තැම්බර් 2017 සිසුන් සඳහා අයදුම්පත් කැඳවීම

**සැලකිය යුතුයි**

i. **2017 අධ්‍යයන වර්ෂයේ ලියාපදිංචි සිසුන් සඳහා විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි II පුනර් පරීක්ෂණයට පෙනී සිටිය හැකි අවසාන අවස්ථාව මෙය බව සලකන්න**

ii. මෙතෙක් පවත්වන ලද විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි II පරීක්ෂණ සඳහා පෙනී සිට C හෝ ඊට ඉහළ සාමාර්ථ ලබාගත් විෂයන් සඳහා මෙම පරීක්ෂණයේදී අයදුම් කළ යුතු නොවේ.

iii. විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි II පරීක්ෂණයන්හි ප්‍රතිඵල ලේඛන අනුව **සමස්ථ ප්‍රතිඵලය 'අසමත්' ලෙස දැක්වෙන සිසුන් E, D, D+, C- යන අසමත් සහ දුර්වල සාමාර්ථයන් ලබාගත් ඉතිරි වී ඇති සියලු විෂයන් අයදුම් කළ යුතු වේ.**

iv. අනුමත විභාග නිර්ණායක අනුව D+ හෝ C- සාමාර්ථයක් සහිතව, GPA අගය 2.00 සම්පූර්ණ වන (වෙබ් අඩවියේ පල කර ඇති ප්‍රතිඵල ලේඛනයේ උපාධි II කොටසේ සමස්ථ ප්‍රතිඵලය **'සමත්'** ලෙස දැක්වෙන) සිසුන් මෙම පරීක්ෂණය සඳහා අයදුම් කළ යුතු නොවේ.

**01. පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට හා පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා පහත උපදෙස් අනුගමනය කරන ලෙස කරුණාවෙන් දන්වමි.**

| | |
|---|---|
| පරීක්ෂණ අයදුම්පත සහ පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු ගිණුම් අංකය | www.external.sjp.ac.lk වෙබ් අඩවියේ Bachelor of Science Business Administration (General) External Degree/Exam Applications වෙත පිවිස ඉහත පරීක්ෂණය යටතේ ඇති වෙබ් පිටුවේ ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය "V"අකුර රහිතව යෙදීමෙන් බාගත (Download) කර ගත හැක. |
| පරීක්ෂණ ගාස්තු<br>එක් විෂයයක් සඳහා<br>විෂයයන් 2 ක් සඳහා<br>විෂයයන් 3 ක් සඳහා හෝ වැඩි සංඛ්‍යාවක් සඳහා | <br>රු. 2000/=<br>රු. 4000/=<br>රු. 6000/= |

| | |
|---|---|
| අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය | සහකාර ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.** |
| අයදුම්පත් යොමු කළ යුතු විද්‍යුත් ලිපිනය | **අයදුම්පත් තැපැල් කිරීමට පෙර exams.edecu@sjp.ac.lk විද්‍යුත් ලිපිනයට ස්කෑන් කර එවිය යුතු අතර ස්කෑන් පිටපත (Scan Copy) සහ අප වෙත එවන දෘඩ පිටපත (Hard Copy) එකම විය යුතුය. වෙනස්කම් සහිත පිටපත් භාරගනු නොලැබේ.** |
| විභාග අයදුම්පත් සහ ලියාපදිංචිය දීර්ඝ කිරීමේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනය | 2024 **අගෝස්තු** 07 |
| **පහත පරිදි ලියාපදිංචිය දීර්ඝ කිරීම අනිවාර්ය වේ**<br><br>2017 වර්ෂයේ ලියාපදිංචි සිසුන්<br>2024-11-30 දින දක්වා | **2017 අධ්‍යයන වර්ෂයේ ලියාපදිංචි සිසුන්ට උපාධි II පරීක්ෂණය සඳහා පෙනී සිටීමට ලැබෙන අවසාන අවස්ථාව මෙය බව කරුණාවෙන් සලකන්න.**<br><br>ලියාපදිංචිය දීර්ඝ කිරීම පිළිබඳ විස්තර www.external.sjp.ac.lk වෙබ් අඩවියේ **Registration renewal** වෙබ් පිටුවට පිවිස ලබාගත හැක. |

02 . **සැලකිය යුතුයි**

I. පාඨමාලා ගාස්තු වාරික 3 ම ගෙවා සම්පූර්ණ කර තිබිය යුතුයි. (2017 ලියාපදිංචි සිසුන්)

II. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පරීක්ෂණ ගාස්තු ගෙවීමෙන් අනතුරුව, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට ප්‍රථම, ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ පරීක්ෂණයේ නම සඳහන් කළ යුතු වේ.

III. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2024 **අගෝස්තු** 07 වන අතර එම දිනයෙන් පසුව කිසිඳු හේතුවක් මත අයදුම්පත් භාර ගනු නොලැබේ.

IV. පුනර් පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා එක් අයදුම්කරුවකු වෙනුවෙන් සුවිශේෂී ගිණුම් අංකයක් බැගින් ඇති අතර අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතුය. **(එහි ඡායාපිටපතක් ළඟ තබාගත යුතු අතර වෙනත් ගිණුම් අංකවලට ගෙවන ලද මුදල් පිළිබඳ විශ්වවිද්‍යාලය වග කියනු නොලැබේ)**

V. **නියමිත පරිදි මුදල් නොගෙවන ලද, ලියාපදිංචිය දීර්ඝ නොකරන ලද අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

VI. විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි II පුනර් පරීක්ෂණ කාල සටහන www.external.sjp.ac.lk යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියේ පලකරන අතර සියළු දැනුවත් කිරීම් වෙබ් අඩවිය හරහා පමණක් සිදුකරන බැවින් නිරතුරුවම වෙබ් අඩවිය පරිශීලනය අත්‍යවශ්‍ය වේ.

VII. විදෙස්ගත සිසුන් සඳහා විභාග අයදුම්පත් ඉදිරිපත් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ පරීක්ෂණ (EDECU Online Distance Supervision Examinations) සඳහා පෙනී සිටිය හැකි වේ. ඒ සම්බන්ධයෙන් විස්තර http://external.sjp.ac.lk/online-exminations-for-migrated-students/ වෙත පිවිසීමෙන් ලබාගත හැකි වේ.

VIII. නියමිත දිනට මෙම පරීක්ෂණය සඳහා සම්පූර්ණ කළ අයදුම්පත් ඉදිරිපත් කළ සිසුන්ගේ විභාග ප්‍රවේශපත්‍ර www.external.sjp.ac.lk වෙබ් අඩවියේ Bachelor of Science Business Administration (General) External Degree/Examinations යටතේ ඇති Admission card වෙත පිවිස ලබාගත හැකි අතර **විභාග ප්‍රවේශපත් තැපැල් මගින් නිකුත් නොකෙරේ.**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය